# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1792/20 - 2013 ජනවාරි මස 09 වැනි බදාදා - 2013.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ මන්නාරම නගර සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා අනුගාමී රැස්වීම් තුනකට වැඩි සංඛ්‍යාවකට නොපැමිණ සිටීමේ හේතුවෙන් මන්නාරම නගර සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

නිලාමුදීන් නහුසීන් නම් වූ සභිකයා අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ මන්නාරම නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන නිලාමුදීන් නහුසීන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මන්නාරම නගර සභාවේ තේරීම්භාර නිලධාරී කහදව ආරච්චිගේ සුමිත් චන්දන වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, නිලාමුදීන් නහුසීන් මහතා මන්නාරම නගර සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

කේ. ඒ. සුමිත් චන්දන,
තේරීම්භාර නිලධාරී,
මන්නාරම නගර සභාව.

2012 දෙසැම්බර් මස 31 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මන්නාරම.

01 - 659

1A - G 17126 — 350 (2013/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.